# 11 ශ්‍රේණිය - ඉතිහාසය

## 04 පාඩම - බ්‍රිතාන්‍යයන් යටතේ ශ්‍රී ලංකාවේ දේශපාලන වෙනස්වීම්

- සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

01) බ්‍රිතාන්‍යයන් යටතේ ක්‍රියාත්මක වූ ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ වර්ෂ සමග පිළිවෙලින් ලියන්න.

**<u>කෝල්බෲක් ප්‍රතිසංස්කරණ</u>**

02) කෝල්බෲක් ප්‍රතිසංස්කරණ ලංකාවට ගෙන ඒමට බලපෑ හේතුව ලියන්න.

03) කෝල්බෲක් ප්‍රතිසංස්කරණ යෝජනා ඉදිරිපත් කරන ලද්දේ කවුරුන්ද?

04) කෝල්බෲක් සාමි හා කැමරන් පිරික්ෂා කර බැලූ ක්ෂේත්‍ර වෙන වෙනම සඳහන් කරන්න.

05) කෝල්බෲක් ප්‍රතිසංස්කරණ යෝජනා මොනවාද?

06) ඉන් 03 ක් විස්තර කරන්න.

07) කෝල්බෲක් ප්‍රතිසංස්කරණ වල දුර්වලතා හා වැදගත්කම සඳහන් කරන්න.

**<u>ආණ්ඩුක්‍රම උද්ඝෝෂණ</u>**

08) කෝල්බෲක් ප්‍රතිසංස්කරණ වල සංශෝධන ඇති කර ගැනිමට මුලින්ම උද්ඝෝෂණය කළේ කවුද එසේ කිරීමට හේතු මොනවාද?

09) උද්ඝෝෂණ ඉදිරිපත් කිරීමට යුරෝපියන් පිහිට වූ සංවිධානය කුමක්ද?

10) එම උද්ඝෝෂණ වලින් ඇතිවූ ප්‍රතිඵල මොනවාද?

11) 20 වන සියවසේදී ලාංකික මධ්‍යම පන්තිය ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ ඉල්ලා සිටියේ ඇයි?

12) ප්‍රථම වරට විධිමත් පෙත්සමක් බ්‍රිතාන්‍යයන් වෙත ඉදිරිපත් කළ ලාංකිකයා කවුද?

13) බ්‍රිතාන්‍යයන්ගෙන් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ ඉල්ලා පෙත්සම් ඉදිරිපත් කළ සංගම් මොනවාද?

14) එම පෙත්සම් වලින් ලාංකිකයන් ඉල්ලා සිටි ප්‍රධාන ඉල්ලීම් මොනවාද?

**<u>අමද්‍යප ව්‍යාපාරය</u>**

15) අමද්‍යප ව්‍යාපාරය යනු කුමක්ද?

16) 1912 අමද්‍යප උද්ඝෝෂණ ආරම්භ වීමට බලපෑ ප්‍රධාන හේතුව කුමක්ද?

17) අමද්‍යප උද්ඝෝෂණයේ කැපී පෙනෙන ලක්ෂණ මොනවාද?

18) අමද්‍යප උද්ඝෝෂණ නිසා බ්‍රිතාන්‍යන්ට මුහුණ දිමට සිදු වූ දුෂ්කරතා මොනවාද?

19) 1915 සිංහල මුස්ලිම් කෝලහාලය යනු කුමක්ද?

20) අමද්‍යප ව්‍යාපාරයේ නායකයා කවුද?

21) ඒ සඳහා නායකත්වය දුන් පිරිස කවුද?

22) අමද්‍යප කටයුතු හරහා දේශපාලනයට පැමිණි නායකයන් කවුද?

23) මෙම ව්‍යාපාරය අඩපණ වීමට බලපෑ හේතු මොනවාද?

**ඉන්දියානු ජාතික ව්‍යාපාරයේ ආභාෂය**

24) 1918 වන විට ලංකාවට වඩා ඉදිරියට ගිය ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ ලබා දිමට බ්‍රිතාන්‍යයන් ක්‍රියා කලේ ඇයි?

25) මෙම උද්ඝෝෂණ මෙහෙය වූ ඉන්දිය නායකයන් කවුද?

26) ඔවුන් ක්‍රියාත්මක කළ සටනේ නම කුමක්ද?

27) ඉහත නායකයන් අතරින් ලංකාවට පැමිණ පුද්ගයන් ඇමතූ ඉන්දිය නායකයා කවුද?

**ලංකා ජාතික සංගමය**

28) ලාංකිකයන්ට වැඩි බලතල ලබා ගැනිම උදෙසා එක්සත් වීමේ අවශ්‍යතාවයක් දැඩිව මතු වූයේ ඇයි?

29) ලංකා ජාතික සංගමය බිහි වූයේ කවදාද?

30) ලංකා ජාතික සංගමයේ ප්‍රථම සභාපති වරයා කවුද?

31) ලංකා ජාතික සංගමය පිහිටුවීමේ ප්‍රධාන අරමුණ කුමක්ද?

**ඩොනමෝර් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය**

32) ඩොනමෝර් කොමිසම ලංකාවට පත් කර එවූ අවධියේ මෙරට සිටි ඉංග්‍රීසි ආණ්ඩුකාරවරයා කවුද?

33) ඩොනමෝර් කොමිසමේ සාමාජිකයන් කවුද?

34) ඩොනමෝර් කොමිසමේ නිර්දේශ මොනවාද?

35) ඩොනමෝර් කොමිසමේ සුවිශේෂ ලක්ෂණ 03 ක් විස්තර කරන්න.

36) රාජ්‍ය මන්ත්‍රණ සභාවට පත් වූ රාජ්‍ය නිලධාරීන් තිදෙනා කවුද?

37) විධායක කාරක සභා ක්‍රමය යටතේ ස්ථාපිත කරනු ලැබූ විධායක කාරක සභා 07 නම් කරන්න.

38) ඩොනමෝර් ආණ්ඩුක්‍රමයේදි අමාත්‍ය මණ්ඩලය සකස් වූ ආකාරය සඳහන් කරන්න.

**නිදහස සඳහා උද්ඝෝෂණ**

39) ලංකා සමසමාජ පක්ෂය පිහිට වූ වර්ෂය කුමක්ද?

40) එම පක්ෂය පිහිට වූ නායනයා කවුද?

41) එම සංගමයේ වෙනත් නායකයෙක් නම් කරන්න.

42) වාමාංශික නායකයෝ නිදහස ඉල්ලා ගෙන ගිය උද්ඝෝෂණ වල ප්‍රචාරක කටයුතු සඳහා යොදා ගත්තේ කුමක්ද?

43) සූරිය මල් ව්‍යාපාරය ආරම්භ වූයේ කුමකට ප්‍රතිවිරුද්ධව ද?

44) පොපි මල් ව්‍යාපාරය ආරම්භ කළේ ඇයි?

45) යුද්ධ සාමදාන දිනය ලෙස නම් කළ දිනය කවදාද?

46) පොපි මල් විකිණිම ආරම්භ කළ වර්ෂය කුමක්ද?

47) වාමාංශික නායකයෝ පොපි මල් හා සූරිය මල් සංකේතවත් කළේ කෙසේද?

**<u>අමාත්‍ය මණ්ඩලය හා ජාතික සංගමය</u>**

48) ලාංකිකයන්ගේ ඉල්ලීම් ඉටුවන ආණ්ඩුක්‍රමයක් ලබා දිමට බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරවරයා හා උසස් නිලධාරීන් කටයුතු කළේ ඇයි?

49) ඇමති මණ්ඩල කෙටුම්පත සැකසුයේ කවදාද?

50) ඒ තුළින් යෝජනා වී තිබුණේ කුමක්ද?

51) ලංකා ජාතික සංගමය මෙරටට නිදහස දිනා ගැනිම අරමුණ බවට පත් කර ගෙන උද්ඝෝෂණ වල නිරත වුයේ කවදා සිටද?

52) පහත වගුව සම්පූර්ණ කරන්න

| වර්ෂය | ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණයේ නම | ව්‍යවස්ථාදායක සභාවේ සංයුතිය (ඇද පෙන්වන්න) | විශේෂ ලක්ෂණ | වැදගත්කම | දුර්වලතා |
|---|---|---|---|---|---|
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |